## දෘශ්‍ය කලා පීඨය සඳහා සිසුන් බඳවා ගැනීමේ අභියෝග්‍යතා පරීක්ෂණය -2024

උක්ත පරීක්ෂණයේ දී අපේක්ෂක අපේක්ෂිකාවන්ට ලකුණු ලැබෙනුයේ පරීක්ෂණ මණ්ඩල 04 කින් දෙනු ලබන ලකුණුවල එකතුවක් ලෙස ය. එක් එක් මණ්ඩලයේ පරීක්ෂකවරුන් විසින් තනි තනිව සිය ලකුණු ලැයිස්තු ස්වාධීනව ලබාදෙනු ඇත. ඒ සඳහා විශ්වවිද්‍යාල අභ්‍යන්තරයෙන් මෙන්ම බාහිර විෂය ප්‍රවීණයන්ගෙන්ද පරීක්ෂණ මණ්ඩල සමන්විත වේ. පරීක්ෂණ මණ්ඩලය සාමූහිකව කථා කොට ලකුණු ලබාදීම සපුරා තහනම් වේ. එසේ තනි තනිව ලකුණු දෙන පරීක්ෂකවරුන්ගේ සංඛ්‍යාව 12කි. එක් අපේක්ෂකයකුගේ සමස්ත ලකුණ සකස් වනුයේ ඉහත දක්වන ලද පරීක්ෂකයින් 12 දෙනා ඇතුළත් මණ්ඩල තුනක ලකුණු අදාලවීමෙනි. විනිවිදභාවය සහතික කිරීම, බලපෑම් කිරීමට ඇති අවකාශය ඉවත් කිරීම හා අපේක්ෂක අපේක්ෂිකාවන්ට ඉහළම සාධාරණයක් ඉෂ්ඨ කිරීම පිණිස මෙම ක්‍රමවේදය පීඨය විසින් අනුගමනය කරනු ලැබේ.

### (1) පළමු පරීක්ෂණය

(ඇඳීම) මානව දේහය ඇඳීම - පැන්සල් හෝ චාකෝල් මාධ්‍යය හෝ භාවිතයෙන් මානව දේහය ඇඳීම.

**ඇගයීම**

i. මානව දේහය රේඛාමය ශක්තියකින් ග්‍රහණය කිරීම.
ii. මානව දේහය ත්‍රිමාන ගුණයකින් යුක්තව ග්‍රහණය කිරීමේ කුසලතාවය.
iii. මානව දේහයෙහි ව්‍යුහාත්මක පිහිටීම පිළිබඳ අවබෝධය.

*(කාලය පැය 02, ලකුණු 35 යි.)*

### (2) දෙවන පරීක්ෂණය

(පින්තාරු කිරීම) - දෙන ලද නිශ්චල ද්‍රව්‍යයක් නිරීක්ෂණයෙන් පින්තාරු කිරීම.

**ඇගයීම**

i. පින්තාරු කිරීමේදී දක්වන නිරායාස ගුණය
ii. වර්ණ සංවේදීතාවය
iii. වස්තූන්හි පෘෂ්ඨීය ස්වභාව ප්‍රකාශනය

*(කාලය පැය 02 විනාඩි 30 , ලකුණු 35 යි.)*

### (3) තෙවන පරීක්ෂණය

කලා රචනය

ඉදිරිපත් කරන නිර්මාණ තුනක් අතුරින් ඔබ විසින් තෝරාගත් එක් නිර්මාණයක් පදනම් කරගෙන එම කෘතියෙහි කලාත්මක හා නිර්මාණාත්මක භාවිතයන් පිළිබඳ විචාරාත්මක රචනාවක් ගොඩනගන්න.
(රචනාව සඳහා අවම වචන 500කි.)

**ඇගයීම**

දෙන ලද නිර්මාණයට අදාල

i . කලා ලක්ෂණ පිළිබඳ සංවේදීතාව
ii. සංකල්ප පිළිබඳ අවධානය
iii. භාෂා භාවිතය හා අදහස් දැක්වීම

*(කාලය පැය 01,ලකුණු 10 යි.)*

## (4) සිව්වන පරීක්ෂණය

### 4.1 නිර්මාණගොනුව

නිර්මාණගොනුව කොටස් දෙකකින් සමන්විතය.

1. අයඳුම්කරු විසින් කරන ලද නිර්මාණ
2. ජයග්‍රහණ තහවුරු කිරීමට නියමිත සහතික

**නිර්මාණගොනුව සහ ලේඛන ඉදිරිපත් කිරීමට අදාළ විශේෂ උපදෙස්:**

1. ඔබට සපයා ඇති විභාග අංකය නිර්මාණ ගොනුවේ ආරම්භක පිටුවේ සඳහන් කරන්න.

2. නිර්මාණ ගොනුවට ස්වාධීන ප්‍රකාශන, මෝස්තර, ද්‍රව්‍ය සම්පින්ඩණ, මානව දේහ අධ්‍යයනය, භූ දර්ශන, නව නිර්මාණ ආදී ඕනෑම නිර්මාණ එකතුවක් ඇතුළත් කළ හැකිය. එසේම මූර්ති, බිතු කැටයම්, ස්ථාපන ආදී රැගෙන ඒමට අසීරු නිර්මාණවල ඡායාරූප නිර්මාණ ගොනුවට ඇතුළත් කළ හැකිය. පරිගණක ආශ්‍රිත නිර්මාණවේ නම් මුද්‍රිත පිටපත් ද ඇතුළත් කරන්න. **නිර්මාණ ගොනුවේ නිර්මාණ 25ත් 30ත් අතර ඇතුළත් විය යුතුය.**

   කැඳවනු ලබන අපේක්ෂක / අපේක්ෂිකාවන් විසින් තමන්ගේ විශේෂ කුසලතා ඉදිරිපත් කිරීම උදෙසා දිනා ඇති ජාතික සහ ජාත්‍යන්තර තරගවලින් ජයග්‍රහණ ලබාගත් සහතික, විශේෂ ප්‍රශංසනාත්මක ලිපිවල **සහතික කළ ඡායාස්ථිත පිටපත්** නිර්මාණ ගොනුව සමග ඉදිරිපත් කළ යුතුය. තවද **එම සහතිකවල මුල් පිටපත් එදිනට රැගෙන ආ යුතුය.**
   **ඔබගේ නිර්මාණ ගොනුව සහ එහි ඇතුළත් සහතික පත්වල මූලික පිටපත් එදිනට ආපසු භාරදෙනු ලැබේ.**

   නිර්මාණ ගොනුවට ඉදිරිපත් කර ඇති කෘති තමාගේ බවට සහතික කර විශ්වවිද්‍යාලය විසින් ඔබ වෙත එවන ලද විභාග අංකය සහ ස්වකීය අත්සන යොදා නිර්මාණ ගොනුව ඉදිරිපත් කළ යුතු වේ.

*නම -----------------------------------------------------------*

*අංකය------------------------------*

*ඉහත නම සහ අංකය හිමි මාගේ නිර්මාණ ගොනුවේ ඇතුළත් කොට ඇති සියළු නිර්මණ මා විසින් කරන ලද බවත් අන් අයගේ නිර්මාණ මෙහි ඇතුළත් නොවන බවත් සහතික කරමි.*
*යම් හෙයකින් වෙනත් අයගේ කෘතීන් බවට තහවුරු වුවහොත් මේ සඳහා හිමිවන ලකුණු අහිමි වන බවත් ඊට එකඟ බවත් පිළිගනිමි.*

*අත්සන--------------------------------------- දිනය------------------------------*

සහතික සඳහා ලකුණු ලබාදීම සඳහා සළකා බලන ඉසව් පහත දක්වා ඇත.

**ජාතික තලය**

අධ්‍යාපන අමාත්‍යාංශය, සංස්කෘතික අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය වැනි පිළිගත් ආයතන මගින් පවත්වනු ලබන අවුරුද්දකට නොඅඩු පාඨමාලා

**ජාතික සහ ජාත්‍යන්තර ජයග්‍රහණ**

මේ සඳහා අදාල වනුයේ ප්‍රථම ස්ථානය, දෙවන ස්ථානය, තෙවන ස්ථානය යන ජයග්‍රහණ පමණක්වේ.

*(කාලය පැය 01,ලකුණු 20 යි.)*

**විශේෂ උපදෙස් -**

**සෑම දිනකම යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන වේලාවන් පහත වගුවේ සඳහන් වේ.**

| **පරීක්ෂණය** | **වේලාව** |
|---|---|
| නිර්මාණගොනුව භාර ගැනීම.<br>(සිව්වන පරීක්ෂණය) | පෙ.ව.8.15 සිට පෙ.ව.8.45 දක්වා<br>**පමණක් භාරගනු ලැබේ.** |
| පළමු පරීක්ෂණය - ඇඳීම | පෙ.ව.9.00 සිට පෙ.ව.11.00 දක්වා |
| තෙවන පරීක්ෂණය - කලා රචනය | පෙ.ව.11.00 සිට මධ්‍යහ්න 12.00 දක්වා |
| දෙවන පරීක්ෂණය - පින්තාරු කිරීම | ප.ව.1.00 සිට ප.ව.3.30 දක්වා |

**ඇඳීමට සහ පින්තාරු කිරීමට අවශ්‍ය කඩදාසි (අඟල් 18x22 ප්‍රමාණයේ) හා වර්ණක මෙන්ම අදාළ උපකරණ ඔබ විසින් රැගෙන ආ යුතුයි.**



පීඨාධිපති
දෘශ්‍ය කලා පීඨය